எனது.இல.
My No } MWCA/2/5/4/4 /2/5- 2025

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

මගේ අංකය. / உமது.இல / Your No. }

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

Ministry of Women and Child Affairs

දිනය. / Date } 2026.09. 16

---

දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්,

<u>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය</u>

<u>මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - **2027**</u>

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරී, උපදේශන සහකාර හා මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව, දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් - 2027 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සියලුම අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය (ඇමුණුම 01) අනුව ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඔබගේ නිර්දේශ සමඟ **2026 සැප්තැම්බර් 29** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතුය.

03. <u>ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්ති:</u>

I. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

II. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02කට අඩු සේවා කාලයක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.</u>

III. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.</u>

IV. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් ස්ථාන මාරුවීම් ඉල්ලීම් නොකළ ද මෙම ස්ථාන මාරුවීම්වලට යටත් වේ.</u>

V. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධරයන් ද ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.

VI. තවද 2026.12.31 දිනට හෝ ඊට පෙර සේවා ස්ථානයන්හි සේවා කාලය වසර 05 සම්පූර්ණ කරන සියලු නිලධරයන් 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කළ යුතුය.

ලේකම් / செயலாளர் / Secretary } 011-2186057
කාර්යාලය / அலுவலகம் / office } 011-2186055
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2187249
ඊමේල් / மின்தபால் / Email } secretary@childwomenmin.gov.lk

05 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
05 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை.
05th Floor, Stage II, Sethsiripaya, Battaramulla

නිහඬ නොවන්න - දරුවන් රැකගන්න    குரல் கொடுங்கள் - பிள்ளைகளைக் காப்பாற்றுங்கள்    Raise your voice to protect children

VII. ස්ථාන මාරුවීමට අපේක්ෂාවෙන් සිටින සහ මින් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධාරීන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ.

VIII. නිලධාරීන් ඉල්ලුම් කර ඇති සේවා ස්ථානයන් ප්‍රමුඛතා පරිදි ලබා දීමට සලකා බලනු ලබන නමුත්, සේවා අවශ්‍යතාව මත ඉල්ලුම් කර නොමැති සේවා ස්ථානයකට වුව ද ස්ථාන මාරු ලබා දිය හැකිය.

IX. නිලධාරීන්ගේ පහසුව සඳහා දැනට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නම් සඳහන් ලේඛනය ඇමුණුම් 02 ලෙස මේ සමඟ ඉදිරිපත් කර ඇත.

X. නිලධාරීන්ගේ 2027 වාර්ෂික ස්ථාන මාරු නිවේදනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු එනම් 2026.09.08 සිට 2027.01.01 දක්වා වූ කාල සීමාව තුලදී සාමාන්‍ය හා සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා නොබලන බව කාරුණිකව දන්වා සිටිමි

XI. එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කරන අතර 2022, 2024 සහ 2025 මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරී ස්ථාන මාරුවීම් වලදී තාවකාලිකව අනුයුක්ත කල නිලධාරීන් සහ එක් කාර්යාලයක දෙදෙනා බැගින් සිටින සියළු නිලධාරීන් වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත විය යුතුය. එසේ ස්ථාන මාරුවීමට අපහසුතාවයක් ඇති නිලධාරීන්ට වෙනත් අමාත්‍යාංශයක් වෙත ස්ථානමාරු වීම් සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.

XII. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලැබෙන අභියාචනා සළකා බලනු නොලැබේ.

04. ස්ථාන මාරුවීම් අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය යටතේ ඔබ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන් දැනුවත් කර, අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ඔබගේ නිර්දේශය සමග ඉදිරිපත් කරන්නේ නම් මැනවි. මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. (http://www.childwomenmin.gov.lk)

තරංගනී වික්‍රමසිංහ

ලේකම්

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 01

**2027 - වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම්පත**

**මුල් ළමාවිය සංවර්ධන සහකාර**

අ. **පෞද්ගලික තොරතුරු**

| | |
|---|---|
| 01. සම්පූර්ණ නම :- | |
| 02. මුලකුරු සමඟ නම :- | |

| | | | |
|---|---|---|---|
| 03. උපන් දිනය:- | 04. වයස :-2026.12.31 දිනට | 05. ජාතික හැඳුනුම්පත් අංකය:- | 06.ස්ත්‍රී / පුරුෂ භාවය :- |

| | | |
|---|---|---|
| 07. ස්ථිර ලිපිනය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල:- |

ආ. **සේවා තොරතුරු**

| | |
|---|---|
| 16. වර්තමාන සේවා ස්ථානය :- | 17. සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය :- |
| 18. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 19. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :- |
| 20. දැනට පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර :- | |

| 21. පූර්ව සේවා විස්තර * | | සේවා ස්ථානය | තනතුර | සේවා කාලය | | එවකට පදිංචි ස්ථානයේ සිට දුර |
|---|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා | |
| | 1 | | | | | |
| | 2 | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 3 | | | | | |
| | 4 | | | | | |
| | 5 | | | | | |

* ඉඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න

ඇ. <u>ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු</u> (ප්‍රමුඛතා අනුපිළිවෙලින් සඳහන් කරන්න)

| අනු අංකය | ඉල්ලුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය | පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී.) යාමට පමණි |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය :- ............................

............................
අයදුම්කරුගේ අත්සන

අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ............................

............................................
දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්ගේ
අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 02

## මුල් ළමාවිය සංවර්ධන සහකාර පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| අනු අංකය | දිස්ත්‍රික්කය | පුරප්පාඩුව |
|---|---|---|
| 1 | පුත්තලම | කල්පිටිය |
| 2 | මොනරාගල | කතරගම |
| 3 | රත්නපුර | කල්තොට |
| 4 | මඩකලපුව | මන්මුනේ බටහිර |
| 5 | ත්‍රිකුණාමලය | කන්තලේ |
| | | පදවි ශ්‍රී පුර |
| | | ගෝමරන්කඩවල |
| 6 | කිලිනොච්චි | පූනකරී |
| 7 | මන්නාරම | මඩු |
| 8 | මුලතිවු | මාන්තෙ (නැගෙනහිර) |
| | | මරිතිමේපත්තු |
| | | තුනුක්කායි |
| | | වැලිඔය |
| 9 | වවුනියාව | වවුනියාව දි.ලේ.කා |
| 10 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | මැදිරිගිරිය |
| | | දිඹුලාගල |
| | | හිඟුරක්ගොඩ |
| 11 | නුවරඑළිය | මතුරට |
| | | නෝර්වුඩ් |